මනෝ විද්‍යාව

# පාසල් ළමුන් හා ඉගෙනීමේ හැකියාව දුර්වලවීම





මනෝ වෛද්‍ය සරත් පඬුවාවල

දරුවන් ඇති මෙරට දෙමව්පියන් නිතර සිහින දකින්නේ ඔවුනට කෙසේ හෝ උගන්වා සමාජයේ ඉහළ මට්ටමක් ලබා දීමටයි. තම දරුවා ඉගෙනීමට උනන්දුවක් නොදැක්වීම හෝ දුබල බවක් පෙන්වීම දෙමව්පියන්ට දැරිය නොහැක්කක් වනු ඇත. ඉගෙනුමට දුර්වල ළමුන් මොට්ටයින් හෝ මැට්ටන් ලෙස හඳුන්වනවා නිතර දක්නට ලැබේ.

මෙවන් හැඳින්වීම් මගින් ඔවුන් තදබල මානසික පීඩාවට ලක්විය හැකි ය.

ළමයකුගේ අධ්‍යාපන හැකියාවන් අදාළ වයසට ගැලපෙන තත්වයට වඩා දුර්වල වීමට හේතුවන කරුණු රැසක් තිබිය හැකි ය.

මේවා අතරින් වඩාත් සුලබ වන්නේ වර්ධන ප්‍රමාදයන් හෙවත් මානසික ඌන වර්ධනය හා සම්බන්ධ දුබලතාවන් ය. අධ්‍යාපන කටයුතු මනාව කරගෙන යාම සඳහා පහත දැක්වෙන මූලික කරුණු තිබිය යුතුය.

**1. තොරතුරු ලබාගැනීමේ හැකියාව**

ළමයා වෙත ඉදිරිපත් කෙරෙන නොයෙකුත් තොරතුරු ඔහුට හෝ ඇයට ග්‍රහණය කර ගැනීමට හැකිවිය යුතුය. ශ්‍රවනය හා දෘෂ්ටිය පිළිබඳ සංවේදන යහපත්ව පැවතිය යුතුය.

**2. මතකය.**

තමා උගත්දේ නැවත මතක් කර ගැනීමේ හැකියාව තිබිය යුතුය. චිත්තවේගීය ගැටළු ආදිය නිසා පැන නගින මානසික අසහනය හා පීඩන මතකය දුබල කරවයි.

**3. අවබෝධය.**

උගන්වන දේ තේරුම් ගැනීමේ හැකියාව ළමයාට තිබිය යුතුය. මේ සඳහා හොඳින් අවධානය යොමු කිරීමට හැකියාවක් තිබිය යුතු අතර තොරතුරු ධාරණය කර ගැනීම සඳහා බුද්ධිමත් ද විය යුතුය.

**4. තොරතුරු සන්නිවේදනය.**

තමා උගත්දේ වාචිකව හා ලිවීම මගින් නැවත ප්‍රකාශ කිරීමේ හැකියාව තිබිය යුතුය.

කථනය හා භාෂාව පිළිබඳ ගැටළු නිසා අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව අඩු වේ.

## මානසික ඌන වර්ධිතයන්

මෙම ළමුන්ට ඉහත සඳහන් කළ මූලික කරුණු සියල්ල සම්බන්ධ ගැටළු පවතී. එවන ළමුන්ගේ වර්ධන අවදීන් හි ප්‍රමාදවීම් (ප්‍රමාදවී ඇවිදීම, කථා කිරීමේ හැකියාව ප්‍රමාදවීම) දක්නට ලැබේ.අන් ළමුන් හා සංසන්දනය කිරීමේදී ආහාර ගැනීම, හැඳ පැළඳ ගැනීම, වැසිකිළියට යාම ආදී තම පෞද්ගලික අවශ්‍යතාවන් පිරිමසා ගැනීමේ හැකියාවන් අඩුබව මොවුන්ගෙන් ප්‍රදර්ශනය වේ. තවද නොයෙකුත් සමාජමය තත්ත්වවලට හැඩ ගැසීමට (එනම් මිත්‍රවීමට, පන්තියේ වැඩ කටයුතුවලට සහභාගී වීම ආදියට) ඔවුනට අපහසු වේ. මානසික ඌන වර්ධිතයින් අතරින් බහුතරයක් මඳ වශයෙන් එම තත්ත්වයෙන් යුක්ත අය වන අතර (මානසික ඌන වර්ධිතයන්ගෙන් 80 % පමණ ) බොහෝවිට ඔවුන්ගේ වර්ධන අවදීන් හි පැහැදිලි අඩුපාඩු නොපෙනීමට පුළුවන.

එවන් ළමුන් හඳුනාගනු ලබන්නේ පාසලේදී ඉගෙනීමේ හැකියාවන්ට දුබල බවක් දක්වන අවස්ථාවේදී ය.

## අන්ධ හා බිහිරි බව

දෘෂ්ටිය හා ශ්‍රවනය පිළිබඳ අඩුපාඩු නිසා තොරතුරු ලබාගැනීමේ හැකියාව අඩුවී යයි.

## ශාරීරික රෝග වලින් පෙළීම

අපස්මාරය, ඇදුම ඇතුළු ශ්වසනාබාධ වලින් නිතර පෙළීම හා දියවැඩියාව වැනි නිදන්ගත අබාධ වලින් පෙළෙන ළමුන්ගේ ඉගෙනීමේ හැකියාවන් දුබල මට්ටමක පවතී. වරින් වර උත්සන්න වන රෝගී තත්ත්ව නිසා පාසලට පැමිණීමට නොහැකිවීම. තම රෝගී බව නිසා

හටගන්නා මානසික කැළඹීම් හේතුවෙන් අවධානය යොමුකිරීමේ හා මතක තබාගැනීමේ හැකියාවත් දුබලවීම මීට හේතුවනු ඇත. තවද ඔවුන් නිතර භාවිත කරන ඖෂධ-වල අතුරු ප්‍රතිඵල, එනම් ක්ලාන්ත, කැරකිලි ගති නිදිබරගති ආදිය ද මේවාට දායක වනු ඇත.

වර්ධනය පිළිබඳ විශේෂිත ආබාධ

සමහර ළමුන් බුද්ධියෙන් සාමාන්‍ය තත්ත්වයක පසු වුවද, මොළයේ යම් යම් වර්ධනයන් හී දෝෂ නිසා ඉගෙනුම පිළිබඳ දුබ-ලතා පෙන්විය හැකිය. මේවා අතර භාෂා වර්ධනය (ලිවීම, කියවීම ආදිය) කණ්ඩායම් කටයුතු ආදිය, පිළිබඳ හැකියාවන් අඩු මට්ටමක පැවතිය හැකි ය. මොවුනට යමක් අවබෝධ කරගැනීමේ හැකියාව තිබුණත් ඒවා අක්ෂර හරියා කාරව භාවිත කර ලිවීමට ප්‍රමාදවීම, ඉස්පිලි පාපිලි ආදිය නොමැතිව වචන ලිවීම, යමක් බලාගෙන කිය-වීමේ අපහසුව ආදී දුබලතා වලින් යුක්ත ය. සමහරුන්ගේ ගණිතමය හැකියාවන් ඉතා දුබල ය. පහසු ගණනය කිරීමක් වුවද කරගත හැකිවන්නේ සැහෙන ප්‍රමාදයකින් පසුව ය. මෙවන් අබාධ තත්ත්ව වලින් පෙළෙන සමහරුන්ගේ චිත්‍ර ඇඳීමේ හැකියාව සාමාන්‍ය වන අතර ඒවා මගින් අදහස් දක්වීමට ඔවුන් ඉතා දක්ෂ විය හැකි ය.

## මානසික පීඩන හා අසහනය

මානසික අසහන නිසා ළමුන්ගේ ඉගෙනීමේ හැකියාවන් දුබල වන අවස්ථා නිතර දක්නට ලැබේ. අප රටේ මීට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ ළමුන්ට හරියාකාරව මානසික සමාජීය වර්ධනයක් නොතිබීමයි.

දෙමව්පියන්ගේ වැඩි ආදරය හා ආරක්ෂාව නිසා ළමුන් තුළ ඇතිවන යැපෙනසුළු බව, නිතර බියපත් වූ බවින් සිටීම, හා සමාජමය කටයුතු වලට මුහුණ දීමට ආත්ම විශ්වාසය හා ආත්ම ශක්තියකින් යුක්ත නොවීම මීට හේතු වනු ඇත.

දෙමව්පියන්ගේ බීමත්කම, වෛවාහික ප්‍රශ්න ඇතුළු ගේ දෙර අඩ දබර, ළමුන් අනවශ්‍ය ලෙස පාලනය කිරීම, හා ඉගෙනීමේ කට-යුතුවල පමණක් යෙදීමට බලපෑම් කිරීම් ආදිය, ළමුන් තුළ අයහපත් මානසික සාමාජීය වර්ධනයක් ඇති කරවයි. ලජ්ජාවෙන් බියෙන් මුළු ගැන්වුනු මෙවැනි ළමුන්ට අවධානය යොමුකිරීමේ හැකියාව අඩුවන අතර මේ නිසා මතකය පිළිබඳ දෝෂ හට ගනී. ඇත්ත වශයෙන් හොඳ බුද්ධියකින් හෙබි ළමුන් වුවද මෙවැනි පීඩන නිසා ඔවුන්ගේ අධ්‍යාපන හැකියාවන් අඩු වීමට පුළුවන.

ඉහත සඳහන් කළ ආකාරයේ ආබාධිත තත්ත්වයන් කලින්ම හඳුනා ගැනීම ඉතා වැදගත් ය. මක්-නිසාද යත් ඒවා තිදත්ගතවීම නව නවත් ගැටළුවලට හේතු විය හැකි බැවිනි.

පාසල් දරුවන්ගේ නොයෙකුත් ගැටළු පිළිබඳව බොහෝවිට හඳු-නාගනු ලබන්නේ පංති භාර ගුරුව-රුන් විසිනි. මෙවැනි දේ නිරීක්ෂණය කළ විට ඒවා දෙමව්පියන්ට දන්විය යුතුය. කෙසේ වුවද යම් නිගම-නයකට එළඹීමට පෙර කාලයක් හොඳින් නිරීක්ෂණය කළ යුතුය. ඒ පිළිබඳව කාරණා දත් අයෙකුට දරුවා යොමු කිරීමට දෙමව්පියන්ට උපදෙස් දිය යුතු ය. දරුවා සම්බන්ධ වාර්තාවක් ගුරුවරයා විසින් දෙමව්පියන්ට දෙනු ලබන්නේ නම් ඉතා අගනේ ය. මෙවැනි වාර්තා-වකට පහත දක්වෙන තොරතුරු අඩංගු විය යුතු ය.

පන්තියේදී දරුවාගේ හැසිරීම

දරුවාගේ අඩුපාඩු, හැකියාවන් හා දක්ෂතාවන් ඇතොත්

(උදා: දරුවන්ගේ කියවීමේ හා ලිවීමේ අපහසුතා තිබුන ද, චිත්‍ර ඇඳීමේ හොඳ හැකියාවක් තිබීම)

ගුරුවරයා සහ පන්තියේ අනෙක් ළමුන් සමග සබඳතා ආදිය

ඉගෙනුම පිළිබඳ දුබලතා තිබුණ ද මෙම ළමුන්ද අත් ළමුන් මෙන්ම අගය කළ යුතු ය. ඉගෙනීම සම්-බන්ධයෙන් ඔවුන් තුළ ඇති අඩුපාඩු විවේචනය නොකළ යුතු ය. ඔවුන්ගේ දක්ෂතා අගය කරමින් දිරි ගැන්විය යුතු ය. ගුරුවරුන් පමණක් නොව දෙමව්පියන් ද හැකි සෑම අවස්ථාවකදීම ළමුන්ගේ අඩුපාඩු පිළිබඳව උනන්දු වී කටයුතු කිරීම ඉතා වැදගත් ය. ❑